# මාසික

# විවරණිකාව

**2009 ඔක්තෝබර්**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

59 වැනි වෙළුම 10 වැනි කලාපය

**2009 ඔක්තෝබර්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.**

# පටුන

පිටුව


| | | | |
|---|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ........... | .......... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන 2009 ඔක්තෝබර් | ........... | .......... | 06 |
| 1. උද්ධමනය තවදුරටත් පහළ වැටෙමින් පස් වසරක් තුළ අවම අගය වන සියයට 0.7 ට ළඟා වෙයි | ........... | .......... | 06 |
| 2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් සමීපස්ථ ණය පහසුකම: සැප්තැම්බර් ඉලක්ක මුදුන්පත්කර ගනී | ........... | .......... | 07 |
| 3. ෆිච් රේටින්ස් (Fitch Rating) ආයතනය, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් සඳහා වන දැක්ම "සෘණාත්මක" මට්ටමේ සිට ස්ථාවර මට්ටම දක්වා සංශෝධනය කරයි | ........... | ........... | 07 |
| 4. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය - 2009 ඔක්තෝබර් | ........... | ........... | 08 |
| 5. 2009 අගෝස්තු මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය | ......... | .......... | 09 |
| 6. 2009 ඔක්තෝබර් මාසයේ උද්ධමනය | ........... | ........... | 13 |
| 7. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (CCPI) | ........... | ........... | 13 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2009 ඔක්තෝබර්

### රාජ්‍ය මූල්‍ය අංශය

- එ.ජ.ඩොලර් දශ ලක්ෂ 500 ක දෙවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සාර්ථකව නිම කරන ලදී.

- පෙට්‍රල් සඳහා ලීටරයකට රු. 3 ක් හා ඩීසල් සඳහා ලීටරයකට රු. 5 ක් ලෙස ආනයන තීරු බදු අත් හැරීමක් ලබාදෙන ලදී.

### ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ණය

උතුරු මැද හා නැගෙනහිර පළාත් මහා මාර්ග ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2009 ඔක්තෝබර් මස 22 වැනි දින ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර වි.ගැ.හි. දශ ලක්ෂ 45.32 ක (ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 8,308 ක) ගිවිසුමකට අත්සන් කරන ලදී. අවුරුදු 8 ක සහන කාලයකට යටත්ව අවුරුදු 32 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය. සහන කාලය තුළදී සියයට 1 ක වාර්ෂික පොලී අනුපාතයක් ද ඉන් අනතුරුව සියයට 1.5 ක වාර්ෂික පොලී අනුපාතයක් ද මෙම ණය මුදල සඳහා අදාළ වේ.

### ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයෙන් ලැබුණු ණය

වරප්‍රසාද නොලත් ප්‍රජාව සංවර්ධනය හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2009 ඔක්තෝබර් මස 22 වන දින ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය අතර වි.ගැ.හි දශ ලක්ෂ 50.4 ක (ආසන්න වශයෙන් රු. දශ ලක්ෂ 9,239) ක ගිවිසුමකට අත්සන් කරන ලදී. අවුරුදු 10 ක සහන කාලයකට යටත්ව අවුරුදු 20 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය. ප්‍රයෝජනයට ගන්නා ණය ශේෂය සඳහා වාර්ෂිකව සියයට 0.75 ක සේවා ගාස්තුවක් හා ප්‍රයෝජනයට නොගත් ශේෂය මත වාර්ෂිකව සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද මෙම ණය මුදල සඳහා අදාළ වේ.

## 2 වන කොටස

# පුවත්පත් නිවේදන

## 2009 ඔක්තෝබර්

### 1. උද්ධමනය තවදුරටත් පහළ වැටෙමින් පස් වසරක් තුළ අවම අගය වන සියයට 0.7 ට ළඟා වෙයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 = 100) ලක්ෂ්‍යමය වෙනස මත පදනම්ව මනිනු ලබන උද්ධමන අනුපාතය, 2009 අගෝස්තු මාසයේ දී පැවැති සියයට 0.9 සිට 2009 සැප්තැම්බර් මාසයේ දී සියයට 0.7 දක්වා තවදුරටත් පහත වැටිණි. මෙය 2004 පෙබරවාරි මාසයේ සිට වාර්තා වූ උද්ධමනයෙහි පහළම අගය වේ. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය ද 2008 නොවැම්බර් මාසයේ සිට දකින්නට ලැබුණු ක්‍රමයෙන් අඩු වන මාවතෙහි ගමන් කරමින්, පූර්ව මාසයේ පැවැති සියයට 8.5 හා සසඳන විට සියයට 6.6 දක්වා තවදුරටත් අඩු විය.*

2009 අගෝස්තු මාසයේදී 208.1ක් වූ කො.පා.මි.ද 208.6 දක්වා ඉහළ යමින්, පූර්ව මාසයට වඩා සියයට 0.2 ක සුළු ඉහළ නැගීමක් පෙන්නුම් කැරිණි. මෙම මාසික ඉහළ යෑම කෙරෙහි ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. මාසය තුළදී නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන, සෞඛ්‍ය, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා නිවාස නඩත්තුව, අධ්‍යාපනය, සහ විවිධ භාණ්ඩ හා සේවා යන කාණ්ඩයන්හි මිල ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රෙදිපිළි හා පාවහන් යන කාණ්ඩයේ පහළ යෑමක් වාර්තා විය. ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමන අනුපාතය 2009 අගෝස්තු මස පැවති සියයට 6.4 සමග සසඳන විට 2009 සැප්තැම්බර් මාසයේ දී සියයට 5.4 ක් දක්වා පහත වැටුණු අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමන අනුපාතය පූර්ව මාසයේ පැවැති සියයට 13.2හි සිට තවදුරටත් අඩු වෙමින් සියයට 12.1 දක්වා පහත වැටිණි.



## 2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් සම්පස්ථ ණය පහසුකම: සැප්තැම්බර් ඉලක්ක මුදුන්පත්කර ගනී

*සම්පස්ථ ණය පහසුකම යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග 2009 සැප්තැම්බර් මාසය සඳහා එකඟ වූ ප්‍රධාන ඉලක්ක සහ ව්‍යුහාත්මක මිනුම් දඬු පහසුවෙන්ම ශ්‍රී ලංකාව විසින් ළඟා කරගෙන ඇත. ශුද්ධ විදේශ සංචිත ඉලක්කගත අගය ඉක්මවා ඇති අතර, දළ නිල විදේශ සංචිත ප්‍රමාණය 2009 සැප්තැම්බර් මස අගවන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 4.2 (මාස 4.7 ක ආනයන සඳහා ප්‍රමාණවත්) මට්ටම දක්වා ඉහළ ගොස් ඇත. සංචිත මුදල්, ඉලක්කගත මට්ටම වූ රුපියල් බිලියන 280.4 තුළ පවත්වාගෙන යන ලද අතර, ශුද්ධ දේශීය මූල්‍යනය ඉලක්කගත මට්ටම වූ රුපියල් බිලියන 305 හා සසඳන විට රුපියල් බිලියන 302.5 ක මට්ටමක පැවතිණි.*

මෙය 2009 ජූලි මස සඳහා සකස් කරන ලද ඉලක්ක සාර්ථක ලෙස ළඟාකර ගැනීම අනුව යමින් සැප්තැම්බර් මස ඉලක්ක සාර්ථක ලෙස ළඟාකර ගැනීමකි. යුද්ධය අවසන් වීම සහ සම්පස්ථ ණය පහසුකම අනුමත වීම හේතුවෙන් ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශකයන්හි දක්නට ලැබුණු ඉහළ වර්ධනයන් අඛණ්ඩව දක්නට ලැබුණි. උද්ධමනය තවදුරටත් පහත බැසීමේ ප්‍රවණතාවයක් පෙන්වූ අතර වෙළෙඳපොළ පොලී අනුපාතික තවදුරටත් පහත බසින ලදී. භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ඵලදා අනුපාතික තවදුරටත් පහත වැටුණු අතර, දින 91 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික 2009 සැප්තැම්බර් මස අගවන විට සියයට 10 වඩා පහළ මට්ටමකට ළඟා විය. සාපේක්ෂ වශයෙන් දිගුකාලීන පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඵලදා අනුපාතිකයන්හි ද පැහැදිලි අඩුවීමක් දක්නට ලැබුණි. මේ අතර, කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2009 ඔක්තෝබර් මස 06 වන දින රුපියල් ට්‍රිලියනය ඉක්මවූ අතර දෛනික සාමාන්‍ය පිරිවැටුම මෙතෙක් ළඟා වූ ඉහළම අගය වාර්තා කළේය.

## 3. ෆිච් රේටින්ස් (Fitch Ratings) ආයතනය, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් සඳහා වන දැක්ම "සෘණාත්මක" මට්ටමේ සිට "ස්ථාවර" මට්ටම දක්වා සංශෝධනය කරයි

*ශ්‍රී ලංකාවෙහි ස්වෛරීත්ව ණය මූලධර්මයන්හි වැඩි දියුණුවීම් පිළිබිඹු කරමින් ෆිච් රේටින්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් සඳහා වන දැක්ම "සෘණාත්මක" මට්ටමේ සිට "ස්ථාවර" මට්ටම දක්වා සංශෝධනය කර ඇත. මේ සමගම, මෙම ආයතනය විසින් දිගුකාලීන දේශීය හා විදේශීය ව්‍යවහාර මුදල් ණය පැහැර හැරීමේ අවදානම සම්බන්ධයෙන් වන ශ්‍රේණිගත කිරීම සහ රටෙහි උඩත් සීමාව බී+ ($B^+$) මට්ටමෙහි ද කෙටිකාලීන ණය පැහැරහැරීමේ අවදානම බී (B) මට්ටමෙහි ද සහතික කර ඇත.*

ෆිච් ආයතනයේ දැක්මට අනුව, 2009 සැප්තැම්බර් අග වන විට විදේශ සංචිත වාර්තාගත ඉහළම අගය වූ එක්සත් ජනපද ඩොලර් බිලියන 4.3 දක්වා වර්ධනයවීම සහ වසර අග වනවිට විදේශ සංචිත එක්සත් ජනපද ඩොලර් බිලියන 5 ක සීමාව පසු කරනු ඇතැයි වන අපේක්ෂාව, ශ්‍රී ලංකාවේ විදේශ මූල්‍ය තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමක් ලෙස සැලකේ.

අනෙක් ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතනය වන ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් (S&P) ආයතනය ද 2009 අගෝස්තු මස 25 වැනි දින ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම සඳහා වන දැක්ම "සෘණාත්මක" මට්ටමේ සිට "ස්ථාවර " මට්ටම දක්වා සංශෝධනය කළේය.

## 4. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය - 2009 ඔක්තෝබර්

*පසුගිය වසරේ වෙළෙඳ ද්‍රව්‍යයන්හි මිල ගණන් වැඩිවීම හේතුවෙන් ඇති වූ ඉහළ පාරිභෝගික මිල ගණන්වල මූලික බලපෑම පහව යෑම සහ ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වන මූලික ලක්ෂණයන් සමග ඉල්ලුම ස්ථායිවීම යනාදී කරුණු හේතුවෙන් ලොවපුරා උද්ධමනය මඳ වශයෙන් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ නමුත්, එළඹෙන මාසයන් තුළ ශ්‍රී ලංකාවේ උද්ධමනය තවදුරටත් අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස හතර තුළ උද්ධමනය සියයට 1 කට ආසන්න මට්ටමක පැවතිණි.*

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියා මාර්ග යන්ට ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ පොලී අනුපාතික වසර තුළ මේ දක්වා ක්‍රමයෙන් පහත බැස ඇති නමුත්, එම ක්‍රියා මාර්ගයන්ට සාපේක්ෂව පොලී අනුපාතික තවදුරටත් අඩුවිය යුතුව ඇත. භාණ්ඩාගාර බිල්පත් මත වන පාදක ඵලදා අනුපාතික පසුගිය වසරෙහි අවසානයෙහි සිට මෙම වසරේ ඔක්තෝබර් පළමු සතිය වන විට පදනම් අකඃ 800 - 865 අතර පරාසයකින් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. පාදක ඵලදා අනුපාතිකයන්හි අඩුවීම එළඹෙන සතිවලදී සෙසු වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි ද පිළිබිඹු වනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරන අතර, එතුළින් ආර්ථික කටයුතු සිදුකරන විවිධ පාර්ශ්වයන්හට ණය ගැනීමේ දී දැරීමට සිදුවන පිරිවැය තවදුරටත් අඩුවනු ඇත. මෙය, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වන යහපත් පෙර දැක්මත් සමග පෞද්ගලික අංශයෙහි ණය උපයෝජනය වර්ධනය කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ආර්ථික ක්‍රියාකාරකම් දිරිමත් කිරීමට ද එය ඉවහල් වනු ඇත.

මෙම වසර තුළ මේ දක්වා අනුගමනය කළ ප්‍රතිපත්ති, අපේක්ෂිත ප්‍රතිඵලය වන දේශීය ණය වෙළෙඳපොළෙහි වාතාවරණය ක්‍රමිකව ලිහිල් කිරීමට තවදුරටත් ඉවහල් වන බැවින්, වර්තමානයේ පවතින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන් නොවෙනස්ව පවත්වාගෙන යාමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2009 නොවැම්බර් 18 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

# 5. 2009 අගෝස්තු මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය

*පසුගිය වසර හයක කාලය තුළ පැවැති තෙවන අවම වෙළෙඳ ශේෂය වාර්තා කරමින් 2009 අගෝස්තු මාසයේ දී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 116 දක්වා සියයට 76.9 කින් අටවන වතාවටත් අඛණ්ඩව අඩු විය. 2008 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,032 ක් වූ සමුච්චිත වෙළෙඳ හිඟය, 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,627 දක්වා සියයට 59.6 කින් පහත වැටුණි. මෙම කාලපරිච්ඡේදය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,195 ක් දක්වා සියයට 9.9 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2009 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ හිඟයට වඩා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 568 ක (සියයට 35 ක් පමණ) අතිරික්තයක් පෙන්නුම් කර ඇත.*

අපනයන ආදායම 2009 අප්‍රේල් මස සිට වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, 2009 වසර තුළ මෙතෙක් පැවැති ඉහළම මාසික අගය වාර්තා කරමින් අගෝස්තු මාසයේ දී එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 710 දක්වා ළඟා විය. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2009 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම සියයට 6.7 කින් පහත වැටුණ ද, පහත රූප සටහනෙන් පෙන්නුම් කරන පරිදි, 2009 අප්‍රේල් මාසයේ සිට එය වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත.




ඛනිජ තෙල් නිෂ්පාදන, දියමන්ති හා ස්වර්ණාභරණ, රබර් නිෂ්පාදන සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණයන්හි අපනයනයන් අඩුවීම හේතුවෙන් කාර්මික අංශයේ අපනයන සියයට 6.0 කින් පහත වැටුණි. කෙසේ වුවත්, රෙදිපිළි හා ඇඟළුම්, ආහාර හා පාන වර්ග සහ අනෙකුත් කාර්මික අපනයන උප කාණ්ඩයන්හි වර්ධනයක් වාර්තා විය. පෙර වර්ෂය සමග සසඳා බැලීමේ දී 2009 අගෝස්තු මාසයේ දී රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 324 ක් දක්වා සියයට 8.5 ක වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් වූ අතර, එය මෙම වර්ෂය තුළ දී මෙම අංශය විසින් වාර්තා කරන ලද ඉහළම ආදායම වේ.

කෘෂිකාර්මික අපනයන අතුරින් තේ අංශය යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන්වූ අතර, පෙර වසරේ අනුරූප මාසය සමග සසඳන විට, 2009 අගෝස්තු මාසයේ දී තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 121 දක්වා සියයට 2.8 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තේ මිල ගණන් ඉහළ මට්ටමක අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි විය. 2009 අගෝස්තු මාසයේ දී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල, වාර්තාගත ඉහළම අගය වූ එ.ජ.ඩොලර් 4.34 කට ළඟා විය. කෙසේ වුවත්, සමස්තයක් වශයෙන් ගත් කල මුළු අපනයනයන්ගෙන් සියයට 23.7 කට දායකත්වය ලබාදුන් කෘෂිකාර්මික අපනයන, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2009 අගෝස්තු මාසයේ දී සියයට 7.4 කින් පහත වැටුණු අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ රබර් සහ අනෙකුත් බොහෝ කෘෂිකාර්මික අපනයනයන්ගේ මිල ගණන් අඩුවීමයි. 2008 අගෝස්තු මාසය සමග සසඳන විට දී පොල් අපනයනයන්ගේ මිල ගණන් මෙන්ම පරිමාවද පහත වැටුණි. සුළු කෘෂිකාර්මික භෝග අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 25 දක්වා සියයට 25.1 කින් අඩු වුව ද, පරිමාව සියයට 34.0 කින් වර්ධනය වූ අතර, මේ සඳහා කොකෝවා නිෂ්පාදන, තල ඇට සහ ගම්මිරිස් අපනයනයන්හි සිදු වූ සැලකිය යුතු වර්ධනය මූලික විය. මැණික් අපනයන විශාල වශයෙන් අඩුවීම හේතුවෙන්, ඛනිජ අපනයන සියයට 30.1 ක පසුබෑමක් වාර්තා විය. 2008 අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී 2009 පළමු මාස අට තුළ දී සමුච්චිත අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,551 ක් දක්වා සියයට 17.2 කින් පහත වැටුණි.

GSP+ සහනයේ ඉදිරි තත්ත්වය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවැතියද, 2009 ඉදිරි මාස කිහිපය සහ 2010 වසර තුළදී අපනයන අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථික අර්බුදය උග්‍රවීමත් සමඟ, යූරෝ සහ බ්‍රිතාන්‍ය පවුම යන මුදල් ඒකක දෙකම වෙනත් බොහෝ මුදල් ඒකක සාපේක්ෂව අවප්‍රමාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල, යූරෝ සහ බ්‍රිතාන්‍ය පවුම් යන මුදල් ඒකක දෙකටම සාපේක්ෂව සැලකිය

යුතු ලෙස අධිප්‍රමාණය වූ අතර 2008 ඔක්තෝබර් මස අගදී ආසන්න ලෙස යුරෝ එකක් සඳහා රුපියල් 140 ක් ලෙසත්, 2009 ජනවාරි මස අගදී බ්‍රිතාන්‍ය පවුමක් සඳහා ආසන්න ලෙස රුපියල් 162 ක් ලෙසත්, ඉහළම අගයන් වාර්තා කළේය. මෙම මුදල් ඒකකයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල බොහෝ ලෙස අධිප්‍රමාණය වුවද, යුරෝපීය වෙළෙඳපොළ තුළ තරඟකාරී ලෙස රැඳී සිටීමට ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට හැකි විය. වාර්තා වූ එම ඉහළම අගයන්හි සිට ශ්‍රී ලංකා රුපියල, යුරෝ සහ බ්‍රිතාන්‍ය පවුම් වලට සාපේක්ෂව ආසන්න ලෙස පිළිවෙළින් සියයට 18.5 කින් සහ සියයට 14.0 කින් අවප්‍රමාණය වී ඇත. යුරෝපා සංගමයේ ඇස්තමේන්තුවට අනුව, GSP+ ක්‍රමය යටතේ වන අඩු තීරු බදු තුළින් 2008 වසරේ දී ලද ප්‍රතිලාභය යුරෝ මිලියන 78 ක් වන අතර, එය එම වසර තුළ සමස්ත අපනයන වලින් සියයට 1.4 ක් පමණ විය. එබැවින් GSP+ සහනය නොලැබුනහොත් එමගින් ඇතිවිය හැකි සියයට 6-7 පමණ වන තීරු බදු අලාභය, ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට දැඩි බලපෑමක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රධාන ආනයන කාණ්ඩ තුනෙහිම අඩු ඉල්ලුමක් පිළිබිඹු කරමින් 2009 අගෝස්තු මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 826 දක්වා සියයට 34.6 කින් පහත වැටුණි. පහත රූප සටහනේ දැක්වෙන පරිදි 2009 මාර්තු මාසය හැරුණු විට අනෙක් සියලුම මාසයන්හි ආනයන වියදම, 2008 වසරේ ආනයන වියදමට වඩා සැලකිය යුතු ලෙසින් පහළ මට්ටමක පැවතිණි.




අන්තර් භාණ්ඩ ආනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 516 දක්වා සියයට 38.5 කින් අඩු වූ අතර, පහළ මිළ ගණන් හේතුවෙන් ඛනිජ තෙල් සහ පොහොර ආනයන වියදම පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2008 අගෝස්තු මාසයේදී එ.ජ.ඩොලර් 127.96 ක්ව පැවැති බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2009 අගෝස්තු මාසයේ දී එ..ජ.ඩොලර් 67.52 දක්වා සියයට 47.2 කින් පහත වැටුණි. මෙම කාලපරිච්ඡේදය තුළදී පොහොර මෙට්‍රික් ටොන් එකක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 344 දක්වා සියයට 67.7 කින් පහත වැටුණි. කෙසේ වුවත්, ඉදිරි මාසවලදී ඇඟළුම් අපනයන වර්ධනය වීමට ඇති හැකියාව පිළිබිඹු කරමින් ඇඟළුම් අපනයනයන්ගේ යෙදවුමක් ලෙස යෙදාගත හැකි රෙදිපිළි හා ඇඟළුම් ආනයන, අගෝස්තු මාසයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 120 දක්වා සියයට 7.7 කින් වර්ධනය විය. භාණ්ඩ මිල සහ ආනයන පරිමාව පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයනය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 150 දක්වා සියයට 21.9 කින් පහත වැටුණි. 2009 අගෝස්තු මාසයේදී ආහාර ද්‍රව්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 56 දක්වා සියයට 30.5 කින් පහත වැටුණු අතර, මේ සඳහා මූලික වූයේ මෝටර් රථ සහ විදුලි උපකරණ ආනයනය පහත වැටීමයි. සියළුම උප කාණ්ඩයන්ගේ පහත වැටීම් පිළිඹිබු කරමින් 2009 අගෝස්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදමද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 150 ක් දක්වා සියයට 30.8 කින් පහත වැටුණි. 2008 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේදී, 2009 වසරේ පළමු මාස අට තුළදී සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් 6,179 ක් දක්වා සියයට 35.2 කින් පහත වැටුණි.

2009 අගෝස්තු මස අගවන විට, දළ නිල සංචිත ප්‍රමාණය ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව පිළිවෙළින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,045.2 ක් සහ 3,890.1 ක් ලෙස වාර්තා විය. එ.ජ.ඩොලර් දශ ලක්ෂ 212.7 ක් වූ රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 797.5 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර මත ලැබුණු ශුද්ධ ලැබීම් ද මෙහි ඇතුළත්ය. පසුගිය මාස 12 තුළ වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව (මසකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 888) ආසියානු නිෂ්කාශණ සංගමයේ අරමුදල් සහිතව සහ රහිතව මෙම දළ නිල සංචිත වටිනාකම් පිළිවෙළින් මාස 4.6 ක සහ 4.4 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

2009 ඔක්තෝබර් මස 13 වැනි දින වන විට ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් හැරුණු විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,500 දක්වා වර්ධනය වී ඇති බව දළ වශයෙන් ඇස්තමේන්තු කොට ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය අඛණ්ඩව අවශෝෂණය කරගැනීම සංචිතවල සිදුවූ සැලකිය යුතු වර්ධනයට මූලික ලෙස හේතු වූ අතර, 2009 මාර්තු මස අවසානයේ සිට ඔක්තෝබර් 15 වන දින දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,529.3 ක් අවශෝෂණය කරගෙන ඇත මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමේසහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ක්‍රියාකාරිත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය - 2009 අගෝස්තු සහ 2009 ජනවාරි - අගෝස්තු

| අයිතමය | 2008 අගෝස්තු එ.ජ.ඩො. මිලියන | 2009 අගෝස්තු එ.ජ.ඩො. මිලියන | අගෝස්තු වර්ධනය (සියයට) | 2008 ජන: සිට අගෝස්තු එ.ජ.ඩො. මිලියන | 2009 ජන: සිට අගෝස්තු එ.ජ.ඩො. මිලියන | ජන: සිට අගෝස්තු වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **761.2** | **710.4** | **-6.7** | **5,497.9** | **4,551.3** | **-17.2** |
| කෘෂිකාර්මික | 181.9 | 168.5 | -7.4 | 1,281.5 | 1,051.0 | -18.0 |
| මෙයින් තේ | 117.7 | 121.0 | 2.8 | 885.6 | 738.3 | -16.6 |
| කාර්මික | 567.1 | 533.3 | -6.0 | 4,126.8 | 3,442.0 | -16.6 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 298.7 | 324.1 | 8.5 | 2,270.9 | 2,162.3 | -4.8 |
| ඛනිජ ද්‍රව්‍ය | 12.2 | 8.5 | -30.1 | 89.6 | 58.2 | -35.0 |
| **ආනයන** | **1,262.1** | **826.0** | **-34.6** | **9,529.9** | **6,178.7** | **-35.2** |
| පාරිභෝගික භාණ්ඩ | 192.2 | 150.1 | -21.9 | 1,782.9 | 1,235.8 | -30.7 |
| අන්තර් භාණ්ඩ | 838.8 | 515.7 | -38.5 | 5,693.1 | 3,427.7 | -39.8 |
| මෙයින් ඛනිජ තෙල් | 417.8 | 218.3 | -47.8 | 2,507.8 | 1,285.0 | -48.7 |
| මෙයින් රෙදිපිළි සහ ඇඟළුම් | 110.9 | 119.5 | 7.7 | 1,088.9 | 915.3 | -16.0 |
| ආයෝජන භාණ්ඩ | **216.7** | **149.9** | **-30.8** | **1,976.0** | **1,435.9** | **-27.3** |
| **වෙළෙඳ ශේෂය** | **-500.9** | **-115.6** | **-76.9** | **-4,032.0** | **-1,627.4** | **-59.6** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **227.1** | **291.7** | **28.4** | **1,996.4** | **2,194.7** | **9.9** |

මූලයන් :- ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## 6. 2009 ඔක්තෝබර් මාසයේ උද්ධමනය

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට (කො.පා.මි.ද.) (2002 = 100) අනුව වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය, 2008 නොවැම්බර් මාසයේ සිට අඛණ්ඩව අඩු වෙමින්, පූර්ව මාසයේ දී පැවැති සියයට 6.6 සිට වසර 5ක් තුළ අවම අගය වූ සියයට 5.2 දක්වා පහත වැටිණි. කො.පා.මි.දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර නොවන සහ බලශක්ති නොවන අයිතමයන්හි මිල විචලනය මගින් ලබන මූලික උද්ධමන අනුපාතය ද 2009 ඔක්තෝබර් මාසයේ දී තවදුරටත් පහත වැටිණි.*

2009 සැප්තැම්බර් මාසයේ දී 208.6 ක් වූ කො.පා.මි.දර්ශකය 209.4 දක්වා ඉහළ යමින්, පූර්ව මාසයට වඩා සියයට 0.4 ක සුළු ඉහළ නැගීමක් පෙන්නුම් කැරිණි. ලක්ෂ්‍යමය පදනම මත මගින් ලබන උද්ධමන අනුපාතය ද 2009 ඔක්තෝබර් මාසයේදී සියයට 1.4 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, එය 2009 සැප්තැම්බර් මාසයේදී සියයට 0.7 ක් විය. මේ අතර, ලක්ෂ්‍යමය පදනම මත මගින් ලබන මූලික උද්ධමනය, 2009 සැප්තැම්බර් මාසයේ සියයට 5.4 සිට 2009 ඔක්තෝබර් මාසය වන විට සියයට 5.1 දක්වා තවදුරටත් පහළ යෑමක් වාර්තා විය. එමෙන්ම, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමන අනුපාතය ද පෙර මාසයට සාපේක්ෂව සියයට 12.1 සිට සියයට 11.0 දක්වා පහත වැටිණි.




## 7. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2007, 2008 සහ 2009

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 |
| ජනවාරි | 151.8 | 183.5 | 203.1 | 1.3 | 3.0 | -0.3 | 13.7 | 20.8 | 10.7 | 10.6 | 16.4 | 21.6 |
| පෙබරවාරි | 155.2 | 188.6 | 202.9 | 2.2 | 2.8 | -0.1 | 15.2 | 21.6 | 7.6 | 11.1 | 17.0 | 20.3 |
| මාර්තු | 155.0 | 191.9 | 202.0 | -0.1 | 1.7 | -0.4 | 15.1 | 23.8 | 5.3 | 11.7 | 17.7 | 18.6 |
| අප්‍රේල් | 156.3 | 195.4 | 201.0 | 0.8 | 1.8 | -0.5 | 14.3 | 25.0 | 2.9 | 12.3 | 18.7 | 16.7 |
| මැයි | 157.3 | 198.5 | 205.1 | 0.6 | 1.6 | 2.0 | 13.2 | 26.2 | 3.3 | 12.6 | 19.8 | 14.7 |
| ජූනි | 160.6 | 205.9 | 207.8 | 2.1 | 3.7 | 1.3 | 13.5 | 28.2 | 0.9 | 12.8 | 21.0 | 12.5 |
| ජූලි | 163.1 | 206.4 | 208.7 | 1.6 | 0.2 | 0.4 | 15.4 | 26.6 | 1.1 | 13.3 | 21.9 | 10.4 |
| අගෝස්තු | 165.2 | 206.3 | 208.1 | 1.3 | 0.0 | -0.3 | 16.5 | 24.9 | 0.9 | 13.8 | 22.6 | 8.5 |
| සැප්තැම්බර් | 166.7 | 207.2 | 208.6 | 0.9 | 0.4 | 0.2 | 16.1 | 24.3 | 0.7 | 14.2 | 23.2 | 6.6 |
| ඔක්තෝබර් | 171.8 | 206.6 | 209.4 | 3.0 | -0.3 | 0.4 | 18.2 | 20.2 | 1.4 | 14.8 | 23.4 | 5.2 |
| නොවැම්බර් | 176.4 | 205.2 | | 2.7 | -0.7 | | 19.3 | 16.3 | | 15.4 | 23.0 | |
| දෙසැම්බර් | 178.1 | 203.7 | | 1.0 | -0.7 | | 18.8 | 14.4 | | 15.8 | 22.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 7. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2007, 2008 සහ 2009

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 |
| ජනවාරි | 151.8 | 183.5 | 203.1 | 1.3 | 3.0 | -0.3 | 13.7 | 20.8 | 10.7 | 10.6 | 16.4 | 21.6 |
| පෙබරවාරි | 155.2 | 188.6 | 202.9 | 2.2 | 2.8 | -0.1 | 15.2 | 21.6 | 7.6 | 11.1 | 17.0 | 20.3 |
| මාර්තු | 155.0 | 191.9 | 202.0 | -0.1 | 1.7 | -0.4 | 15.1 | 23.8 | 5.3 | 11.7 | 17.7 | 18.6 |
| අප්‍රේල් | 156.3 | 195.4 | 201.0 | 0.8 | 1.8 | -0.5 | 14.3 | 25.0 | 2.9 | 12.3 | 18.7 | 16.7 |
| මැයි | 157.3 | 198.5 | 205.1 | 0.6 | 1.6 | 2.0 | 13.2 | 26.2 | 3.3 | 12.6 | 19.8 | 14.7 |
| ජුනි | 160.6 | 205.9 | 207.8 | 2.1 | 3.7 | 1.3 | 13.5 | 28.2 | 0.9 | 12.8 | 21.0 | 12.5 |
| ජූලි | 163.1 | 206.4 | 208.7 | 1.6 | 0.2 | 0.4 | 15.4 | 26.6 | 1.1 | 13.3 | 21.9 | 10.4 |
| අගෝස්තු | 165.2 | 206.3 | 208.1 | 1.3 | 0.0 | -0.3 | 16.5 | 24.9 | 0.9 | 13.8 | 22.6 | 8.5 |
| සැප්තැම්බර් | 166.7 | 207.2 | 208.6 | 0.9 | 0.4 | 0.2 | 16.1 | 24.3 | 0.7 | 14.2 | 23.2 | 6.6 |
| ඔක්තෝබර් | 171.8 | 206.6 | 209.4 | 3.0 | -0.3 | 0.4 | 18.2 | 20.2 | 1.4 | 14.8 | 23.4 | 5.2 |
| නොවැම්බර් | 176.4 | 205.2 | | 2.7 | -0.7 | | 19.3 | 16.3 | | 15.4 | 23.0 | |
| දෙසැම්බර් | 178.1 | 203.7 | | 1.0 | -0.7 | | 18.8 | 14.4 | | 15.8 | 22.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව